# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,988 - 2016 ඔක්තෝබර් මස 07 වැනි සිකුරාදා - 2016.10.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 1244 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 1249 |


*සැ. යු.* - එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත, 2016 ජුනි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ඔක්තෝබර් 28 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ඔක්තෝබර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම

## ගම්පහ දිසා අධිකරණයේ දී ය

බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 3 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් අංක 59(1) ''ආ'' සහ 59(3) වගන්තිය යටතේ සහ 1983 අංක 32 සහ 1992 අංක 11 දරන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 59(1) ආ සහ 59(3) වගන්තිය යටතේ කරන ඉල්ලීමයි.

*නඩු අංක* : 4644/SPL
*පිස්කල් අංක* : 18/2015

ගම්පහ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්,
වලව්වත්ත, කිඩගම්මුල්ල, ගම්පහ.

...................................*පෙත්සම්කරු.*

*එදිරිව*

01. ප්‍රැන්සිස්කුදුර සුචිත්‍රා ඉනෝකා ගයාත්‍රි සිල්වා,
අංක 314, ඇටකොරස, රාගම.
02. අමරසිංහ කළුආරච්චිගේ රංජිත් ප්‍රියන්ත,
අංක 26, විශාඛාවත්ත, ගල්ලවත්ත, ඒකල, ජාඇල.
03. ප්‍රැන්සිස්කුදුර සැම්සන් සිල්වා,
අංක 314, ඇටකොරස, රාගම.

............................*වගඋත්තරකරුවන්.*

වර්ෂ 2014 ක් වූ ජුනි මස 20 වැනි දින ගම්පහ දිසා අධිකරණය විසින් දෙන ලද නියෝගය අනුව මෙම නඩුවේ ඉහත නම සඳහන් පළමු වගඋත්තරකරුගෙන් පෙත්සම්කරු හට අයවිය යුතු රුපියල් අටලක්ෂ අනූපන්දහස් පන්සිය හැත්තෑ අට (රු. 8,95,578) ක මුදලක් අයකර ගැනීම සඳහා ද, මෙම නඩුවේ තක්සේරු නඩු ගාස්තු ආදිය අයකර ගැනීම සඳහා ද, එම මුදල මත නඩුවේ දින දක්වා කාලයට ඊට අදාළ වාර්ෂිකව 20% ක පොළිය අයකර ගැනීම සඳහා ද, මෙම නඩුවේ තක්සේරු නඩු ගාස්තු ආදිය අයකර ගැනීම සඳහා ද, තීන්දු ප්‍රකාශ කරනු ලැබේ. ඉහත නම සඳහන් පළමුවන වගඋත්තරකරු වන ප්‍රැන්සිස්කුදුර සුචිත්‍රා ඉනෝකා ගයාත්‍රි සිල්වා යන අය විසින් පෙත්සම්කරු හට ගෙවිය යුතු බවට කරනු ලබන තීන්දු ප්‍රකාශය ඉටුකිරීමට පැහැර හැර ඇති බැවින් 2015.03.25 දින මා විසින් තහනමට ගන්නා ලද නිශ්චල දේපල වර්ෂ 2016 ක් වූ ඔක්තෝබර් මස 20 වැනි දින පෙ.ව. 11.00 ට විත්තිකරුවන්ගේ දේපල පිහිටි අංක 314, ඇටකොරස, රාගම යන ස්ථානයේ දී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද, පිස්කල් ගාස්තු ද, රජයට අයවිය යුතු ගාස්තු, තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට් පත්‍රයේ* ගාස්තු සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් එවෙලේම මුදලින් මා වෙත ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් 75% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත ගම්පහ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

### උපලේඛනය

*නිශ්චල දේපල*.- බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ රාගම උපකාර්යාලයට අයත් රාගම පිහිටි ''සියඹලාගහවත්ත, උදහැටියාමුල්ල සහ දවටගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එච්. ඊ. මෙන්දිස් මහතා විසින් මැන සාදන ලද අංක 5224 සහ 1987.09.21 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කළ ලොට් 2 දරන බිම් කොටස නැවතත් මැන බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා මහතා විසින් මැන සාදන ලද අංක 5894 සහ 1999.04.01 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කළ ලොට් 2A දරන බිම් කොටසට මායිම් උතුරට : බස්නායකගේ ඉඩම ද, නැගෙනහිරට : ලොට් 2 B සහ ලොට් 2 හි ඉතිරි කොටස ද, දකුණට : ලොට් 2 ද, බස්නාහිරට : බස්නායකගේ ඉඩම සහ මෙකී ඉඩමේම ලොට් 1 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතරයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 14.25) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සැම සියලු දේ ද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 407/03 හි ලියාපදිංචි වී ඇත.

ඒ. එච්. අදිකාරි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය, ගම්පහ.

වර්ෂ 2016 ක් වූ සැප්තැම්බර් මස 08 වැනි දින දී ය.

10-89

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

### කොළඹ දිසා අධිකරණයේ දී ය

සංශෝධිත පරිදි වූ 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සහ ඊට අනුකූල නෛසයි තීන්දු ප්‍රකාශයක් සහ නියත තීන්දු ප්‍රකාශයක් සඳහා ඉල්ලීම පිළිබඳ කාරණයේ දී ය.

*කොළඹ දිසා අධිකරණයේ*
*නඩු අංක* : D. D. R 183/2014
*ස්වභාවය* : ඩී. ආර්.
*කාර්ය පටිපාටිය* : ලඝු
*වටිනාකම* : රු. මිලියන 11
*ගම්පහ දිසා අධිකරණයේ*
*ඇස්කීසි අංක* : 71/2016

කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 (කලින් අංක 481) දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ කොළඹ 14, සාන්ත ජෝසප් වීදියේ, අංක 182 හි ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ.)

........................................*පැමිණිලිකරු.*

*එදිරිව*

අබ්දුල් රහීම් මොහොමඩ් රිස්වාන්,
අංක 203/21, ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ,
කොළඹ 14,

සහ තව ද ,

අංක 553/3, ගොංගිතොට පාර, එඬේරමුල්ල, වත්තල.

............................................*විත්තිකරු.*

ඉහත අංක සඳහන් නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියට අනුව පහත උපලේඛනයේ සඳහන් දේපල 2016.08.01 වැනි දින මා විසින් තහනම් කිරීමෙන් පසු ඉහත නම් සඳහන් විත්තිකරු විසින් නෛයිසයි තීන්දු ප්‍රකාශිත මුදල පැමිණිලිකාර බැංකුවට ගෙවීම පැහැර ඇති හෙයින් රු. 51,21,822/09 ක මුදලක් සහ 2014 මැයි මස 01 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් ඒ සඳහා වසරකට 15% බැගින් වාර්ෂික පොලිය ද සමග ගෙවන ලෙස ද, රු. 49,45,968.61 ක මුදලක් සහ 2014 මැයි මස 01 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ සඳහා 17% බැගින් වූ වාර්ෂික පොලිය ද, නඩු ගාස්තු ද විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට තීරණය කර ඇති අතර, එකී ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති හෙයින් කොළඹ දිසා අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රය පිට විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල.

වර්ෂ 2016ක් වූ නොවැම්බර් මස 28 වැනි දින ප. ව. 2.30 ට විත්තිකරුගේ දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් සියයට විසි පහක් (25%) මුදලක් ද පිස්කල් ගාස්තු, රජයට අය විය යුතු, තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට් පත්‍රයේ* සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් එවෙලේම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක් පත් භාර ගනු නොලැබේ. ගැනුම් මිලෙන් සියයට හැත්තෑ පහක (75%) ඉතිරි මුදල දින 30 ක් ඇතුළත ගම්පහ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 225/බී එඬේරමුල්ල ග්‍රාම නිලධාරි කොටසේ මහර එඬේරමුල්ලේ පිහිටි ගොංගිතොට පාරේ වරිපනම් අංක 147/04 දරන දවටගහ වත්ත නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක වී. එෆ්. ජේ. පෙරේරා විසින් මැන බෙද වෙන්කර අංක 12609 දරන පිඹුර යටතේ 1997.06.30 වැනි දින සකස් කර කැබලි අංක 1බී1 වශයෙන් ලකුණු කරන ලද ඉඩමට, උතුරට : බලයලත් මානක වී. එෆ්. ජේ. පෙරේරා විසින් පිඹුරුපත් අංක 13610 යටතේ 1997.06.30 දින සකස් කර ලකුණු කර ඇති කැබලි අංක 1බී3 න් ද සහ කැබලි අංක

1 බී 2 න් ද, නැගෙනහිරට : කැබලි අංක 2න් ද, දකුණට : කැබලි අංක 4 සහ බස්නාහිරට : එච්. ඩී. පෙරේරාගේ මෙම ඉඩමේ ම ඒ දරන කොටසෙන් ද, මායිම් වූ සහ එකී පිඹුරුපත් අංක 13609 අනුව පර්චස් එකොළහකින් සමන්විත වූ (අ. 0, රූ. 0, පර්. 11) ඉඩමේ ඇති ගහකොළ ගොඩනැගිලි සහ එහි ඇති අනෙකුත් සියලු දේ ඇතුළුව ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරු අංක M 50/88 හි ලියාපදිංචි කර ඇත. මාර්ග අයිතිය සඳහා පත්ඉරු අංක M 50/89, M 50/90 සහ M 50/91 බලන්න.

ඒ. එච්. අදිකාරි,<br>
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,<br>
දිසා අධිකරණය,<br>
ගම්පහ.

2016 ක් වූ සැප්තැම්බර් මස 20 වැනි දින දී ය.

10-114

---

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන සහ සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

දීප්ති දැසමන් රත්නවීර,<br>
අංක 31, ජින්නා පාර,<br>
වැලිගම.

*නඩු අංකය* : CHC 73/2013/MR<br>
*ඇස්කීසි අංකය* : 05/2014

................................*පැමිණිලිකරු.*

*එදිරිව*

C. I. F. L. ෆයිනෑන්ස් ඇන්ඩ් ඇසට්<br>
මැනේජ්මන්ට් ලිමිටඩ්,<br>
අංක 71, ග්‍රෙගරි පාර,<br>
කොළඹ 07.

..................................*විත්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කර ඇති වර්ෂ 2014 ක් වූ අප්‍රේල් මස 25 වැනි දින දරන තීන්දු ප්‍රකාශය පරිදි විත්තිකරුට එරෙහිව පැමිණිලිකරු වෙත රුපියල් පනස් අට ලක්ෂ විසි පන්දහස් අටසිය පහයි ශත පනස් හතර (රු. 58,25,805.54) ක මුදලක් සහ පැමිණිල්ලේ දින සිට තීන්දු ප්‍රකාශයේ දින වන වර්ෂ 2014 ක් වූ අප්‍රේල් මස 25 වැනි දින දක්වා නෛතික පොළිය ද, තීන්දු ප්‍රකාශයේ දින සිට තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යොදවා එකී මුදල පැමිණිලිකරු වෙත ගෙවනු ලබන දිනය තෙක්, එකී මුදල් මත නෛතික පොළිය ද සහ අධිකරණයේ නිලධාරියෙකු විසින් තක්සේරු කරන ලද නඩු ගාස්තු ද පැමිණිලිකරුට ගෙවන ලෙසට නියෝග කර ඇති අතර, එකී ගෙවීම් කිරීමට මෙම විත්තිකරු අපොහොසත් වී පැහැර හරින්නේ නම්, එකී මුදල අයකර පැමිණිලිකරුට දීම සඳහා ගරු අධිකරණයේ 2013.11.20 දිනැති නියෝගය ප්‍රකාරව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 653 වගන්තිය ප්‍රකාරව දැනටමත් තහනමට ගෙන ඇති පහත පළමුවැනි හා දෙවැනි උපලේඛනයන්හි සවිස්තරව විස්තර කර ඇති විත්තිකරුට අයත් විත්තිකරුගේ ඉඩම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියෝග කර ඇති හෙයින්,

ඉහත කී මුදල් තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මාස දෙකක් (02) ඇතුළත පැමිණිලිකරුට ගෙවිය යුතු බවට හා එසේ ගෙවීම පැහැර හැර ඇති බැවින්, මෙහි පහත උපලේඛනවල විස්තර කොට ඇති එකී ඉඩම් එහි හිමිකම් අධිකරණයේ පිස්කල් මගින් විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට, වැඩිදුරටත් ආඥා කර ඇති හෙයින් ද,

එකී වෙන්දේසිය පැවැත්වීම ගරු අධිකරණය විසින් මා පත්කොට සංස්ථාපනය කර ඇති හෙයින් පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් දේපළ, ඒවා පිහිටි ස්ථානයේ දී ම 2016 නොවැම්බර් මස 11 දින ප. ව. 3.00 ට මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තව ද මෙම ප්‍රසිද්ධ වෙන්දේසියේ ලංසු තබා දේපල මිළදී ගන්නා ගැණුම්කරු වෙන්දේසියේ සම්පූර්ණ ගැණුම් මුදල හෝ එම මුදලින් 25%ක් ද, වෙන්දේසි ගාස්තු හා රජයේ ගාස්තු එම වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින් ගෙවිය යුතු අතර, ඉතිරි 75% දින 30ක් ඇතුළත මෙම අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

*දේපළට ප්‍රවේශ මාර්ගය* : හොරණ සිට අගුරුවාතොට පාරේ (කළුතර පාරේ) කි. මී. 2 ක් පමණ යනවිට හමුවන බැල්ලපිටිය හන්දියෙන් වමට ඇති වල්පිට පාරේ කි. මී. 1 1/2 ක් පමණ ගමන් කරන විට හමුවන දකුණට ඇති පාරේ මීටර් 250 ක් පමණ ගමන් කළවිට මෙම ඉඩමට ප්‍රවේශ විය හැකි ය.

### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කොරළේ මුංවත්ත බාගේ පත්තුවේ මදුරාවල ප්‍රාදේශීය සභා බලසීමාව තුළ වේරවත්තේ පිහිටි ''ගම්මැටිහේන'' *හෙවත්* දැනට ''වේරවත්ත එස්ටේට්'' ලෙස හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. අධිකාරම් විසින් වර්ෂ 2003 ජනවාරි මස 23 වැනි දින මැන සාදන ලද අංක 1986 දරන පිඹුරේ ලොට් අංක. 07 දරන කොටසට බලයලත් මිනින්දෝරු නලින් හේරත් විසින් වර්ෂ 2008 ඔක්තෝබර් මස 13 වැනි දින නැවත මැන සාදන ලද අංක 2509 පිඹුරේ ලොට් අංක 7A දරන කොටසට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | යසවති විතාන, හඳපාන්ගොඩගේ මාටින් සිංඤෝ, හෙට්ටිවත්තගේ නලින්දාස, ඩබ්. චන්ද්‍රසේන, හපුතන්ත්‍රිගේ ජිනදාස සහ එස්. ඒ. පීරිස් සිංඤෝ යන අයට අයත් ඉඩම ද, |
| නැගෙනහිරට | : | කන්දවීන ඉඩම සහ කන්දවීන කුඹුර ද, |
| දකුණට | : | බෝමළුව ද, පී. සිරිපාල, විල්සන් පෙරේරා, පී. ගුණසේන සහ පී. ලොකුනෝනා යන අයට අයත් ඉඩම ද, |
| බටහිරට | : | ප්‍රාදේශීය සභා පාර සහ යසවතී විතාන යන අයට අයත් ඉඩම ද, |

යන මායිම් තුළ පිහිටි අක්කර දහයයි රූඩ් දෙකයි පර්චස් දශම තිස්පහක් (අක්. 10, රූඩ්. 2, පර්. 00.35) *හෙවත්* හෙක්ටයාර් 4.2500 විශාල ඉඩම සමග ඒ තුළ පිහිටි පරණ රබර් වගාව සහ අනෙකුත් සියලු දේ සමග ය.

ඉහත සඳහන් ලොට් අංක 7A දරන කොටස පහත දැක්වෙන ඉඩමෙන් නැවත මැන සාදන ලද්දකි.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ මුංවත්ත බාගේ පත්තුවේ මදුරාවල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ වේරවත්තේ පිහිටි "ගම්මැටිහේන" *හෙවත්* දැනට "වේරවත්ත එස්ටේට්" ලෙස හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක විසින් වර්ෂ 1991 නොවැම්බර් මස 25 වන දින මැන සාදන ලද අංක 690/91 දරන පිඹුරේ ලොට් අංක 07 දරන කොටසට බලයලත් මිනින්දෝරු ජී. අධිකාරම් විසින් වර්ෂ 2003 ජනවාරි මස 23 වන දින නැවත මැන සාදන ලද අංක 1986 දරන පිඹුරේ ලොට් අංක 7 දරන කොටසට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | යසවති විතාන, හඳපාන්ගොඩගේ මාටින් සිංඤෝ, හෙට්ටිවත්තගේ නලින්දාස, ඩබ්. චන්ද්‍රසේන, හපුතන්ත්‍රිගේ ජිනදාස සහ එස්. ඒ. පීරිස් සිංඤෝ යන අයට අයත් ඉඩම ද, |
| නැගෙනහිරට | : | බුදිනිස් කොතලාවල යන අයට අයත් කන්දවීන ඉඩම ද, කන්දවීන කුඹුර ද, කන්දවින ඉඩම සහ බෝමළුව ද, |
| දකුණට | : | බෝමළුව ද, පී. සිරිපාල, විල්සන් පෙරේරා, පී. ගුණසේන සහ පී. ලොකුනෝනා යන අයට අයත් ඉඩම ද, |
| බටහිරට | : | පී. සිරිපාල, විල්සන් පෙරේරා, පී. ගුණසේන සහ පී. ලොකුනෝනා යන අයට අයත් ඉඩම ද, වී. සී. පාර සහ යසවතී විතාන යන අයට අයත් ඉඩම ද, |

යන මායිම් තුළ පිහිටි අක්කර දහයයි රූඩ් දෙකයි පර්චස් පහක් (අක්.10, රූඩ්.2, පර්.05) *හෙවත්* හෙක්ටයාර් 4.2618 විශාල ඉඩම සමග ඒ තුළ පිහිටි පරණ රබර් වගාව සහ අනෙකුත් සියලු දේ සමග ය.

මෙම ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක D/136/149 සහ D/244/206, J/121/100 දරන පත්‍රිරුවල ලියාපදිංචි වී ඇත.

ප්‍රේමසිරි වඩුගේ,
රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,
සමාදාන විනිසුරු (මුළු දිවයිනටම).

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ 12, වාණිජ මහාධිකරණයේ දී ය.

10-426/1

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන සහ සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී, එහි ලියාපදිංචි කාර්යාලය සහ/හෝ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය කොළඹ 01, බ්‍රිස්ටල් වීදියේ අංක. 21 දරන ස්ථානයේ පිහිටා ඇති අතර, "මොරටුව ශාඛාව" යනුවෙන් සඳහන් කරනු හා හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාර ස්ථානයක් මොරටුව, පරණ ගාලු පාරේ, අංක. 116 දරන ස්ථානයේ පිහිටා ඇත.

.............................*පැමිණිලිකරු.*

*නඩු අංකය :* CHC 137/2012/MR

*එදිරිව*

1 ඒ. පී. විජේනායක,
අංක 65, මෙඩෝ ග්‍රෝව්,
ෂයර්හැම්ටන්, බ්‍රිස්ටල් බීඑස් 119 පීඑල්,
එක්සත් රාජධානිය,

*සහ*

අංක 173,
මාදෙල්ගමුව,
ගම්පහ.

...................................*විත්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2015 ක්වූ ජනවාරි මස 22 වන දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාරව, ඉහත නම් කර ඇති විත්තිකරු විසින් පැමිණිලිකරුට,

රු. 3,218,724/26 ක්වූ (තුන් මිලියන දෙලක්ෂ දහඅට දහස් හත්සිය විසි හතරයි ශත විසි හයක්) සහ රු. 2,856,964/99 ක් වූ මුදලක් මත (එනම් රු. 3,218,724/26 ක්වූ එකී මුළු මුදලින් ගෙවීම හිඟ තබා ඇති ප්‍රාග්ධන මුදල) 2011 අගෝස්තු මස 06 වන දිනයෙන් ආරම්භව වර්ෂයකට 14.5% ක අනුප්‍රමාණයක් අනුව වූ පොලියක් සහ රු. 361,759/27 ක්වූ එකී මුදල මත (එනම් රු. 3,218,724/26 ක් වූ එකී මුලු මුදලින් 2011.08.05 වන දිනට ගෙවීම හිඟ තබා ඇති පොලී කොටස) 2011 අගෝස්තු මස 06 වන දිනයෙන් ආරම්භව තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් නෛතික පොලිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ මුලු මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් ඒ මුලු මුදල මත නෛතික පොලිය ගෙවිය යුතු බවට සහ රු. 367,031/84 ක මුදලක් (තුන් මිලියන හැට හත් ලක්ෂ තිස් එකයි ශත අසූ හතරයි) ඒ මුදල මත පැමිණිල්ලේ දිනයේ සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් නෛතික පොලිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ මුලු මුදල මත නෛතික පොලිය ගෙවිය යුතු බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද, තව ද, ඉහත නම සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට අධිකරණයේ නිලධාරියෙකු විසින් නියමිත පරිදි තක්සේරු කරනු ලබන මෙම නඩුවේ නඩු ගාස්තු ගෙවිය යුතු බවට ද වැඩිදුරටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තව ද, මෙහි සහ තීන්දු ප්‍රකාශයේ උපලේඛනයේ සහ/හෝ X3 වශයෙන් සලකුණු කොට පැමිණිල්ලට අමුණා ඇති උකස් බැඳුම්කරයේ උපලේඛනයේ විස්තර කර ඇති, එකී ඉඩම සහ පරිශ්‍රය පැමිණිල්ලේ අ (i) හා අ (ii) අයැදීම්වල වඩාත් සවිස්තරව ප්‍රකාශ කර ඇති ඉහත කී මුදල් ප්‍රමාණයන් ගෙවීම සඳහා බැඳී පවතින බවට හා ක්‍රියාවේ යෙදවිය හැකි බවට නියෝග කර තීන්දු ප්‍රකාශ ඇති හෙයින් ද,

තව ද, විත්තිකරු විසින් තීන්දු ප්‍රකාශය ප්‍රකාරව ඉහත කී පරිදි අයවිය යුතු මුදල් නියමිත පරිදි ගෙවා නිම නොකළ හෙයින් ද, එම තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කිරීම සඳහා උකසට බැඳි දේපල වෙන්දේසියේ විකිණීමේ නියෝගයක් නිකුත් කර ඇති හෙයින් ද,

තව ද, එම තීන්දු ප්‍රකාශයේ අඩංගු නියෝගයන් හා කොන්දේසිවලට අනුකූලව සහ අධිකරණයේ විකිණීමේ කොන්දේසි අනුමත කිරීමෙන් පසු මෙහි සහ තීන්දු ප්‍රකාශයේ උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ ස්ථානය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර් නියෝජ්‍ය පිස්කල් වන මා පත්කොට සංස්ථාපනය කර ඇති හෙයින් ද, පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම සහ ස්ථානය ඒවා පිහිටි ස්ථානයේ දී ම 2016 නොවැම්බර් මස 07 දින ප.ව. 3.00 ට මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තව ද, මෙම ප්‍රසිද්ධ වෙන්දේසියේ ලංසු තබා දේපල මිළදී ගන්නා ගැණුම්කරු වෙන්දේසියේ සම්පූර්ණ ගැණුම් මුදල හෝ එම මුදලින් 25% ක් ද, වෙන්දේසි ගාස්තු හා රජයේ ගාස්තු එම වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින් ගෙවිය යුතු අතර, ඉතිරි 75% දින 30 ක් ඇතුළත මෙම අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

*දේපලට ප්‍රවේශ මාර්ගය* : ජාඇල මිනුවන්ගොඩ පාරේ කි.මී. 6 ක් පමණ ගමන් කළ විට හමුවන (කොටුගොඩ හන්දිය) කොටුගොඩ පාලමෙන් දකුණට ඇති ගම්පහ පාරට ප්‍රවේශ වී එම මාර්ගය ඔස්සේ කි.මී. 2 ක් පමණ ගියවිට ට්‍රාන්ස්ෆෝමරයත් සමග දකුණට ඇති ජානක තිලකරත්න මාවතේ මීටර් 500 ක් ඉදිරියට ගිය විට මදුරුවිට වම් අත පැත්තේ ඇති කඩය පසු කරනවාත් සමග වමට ඇති කොන්ක්‍රීට් පාරේ (වම් අත පැත්තේම 4 වන නිවස) ගමන් කළ විට මෙම ඉඩමට ප්‍රවේශ විය හැකි ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ දසිය පත්තුවේ, සියඹලාපිටිය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, උතුරින් : අංක 2166 පිඹුරේ අංක 6 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් : අංක 2166 පිඹුරේ අංක 24 බිම් කැබැල්ලෙන්, දකුණින් : අංක 2166 දරන පිඹුරේ අංක 4 බිම් කැබැල්ලෙන් හා බස්නාහිරින් : එම්. ඒ. ආර්. එල්. ඩයස් විසින් හිමිකම් දක්වා සිටින ඉඩමෙන් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු එච්. ඩබ්. ඒ. ද සිල්වා විසින් සාදන ලද අංක. 1659 හා 2001 මාර්තු මස 03 වන දින පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් විස්සකින් (අ : 0 රූ : 0 පර් : 20) යුක්ත වූද හෙක්ටයාර් (හෙ : 0.0506) කෝන්ගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක. 1659 දරන පිඹුරේ නිරූපිත අංක.1 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද, බෙදා වෙන් කළ හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

එකී ඉඩම් කැබැල්ලට අදාල මාර්ග අයිතිය ද සමග වේ.

ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 225/287 හිමිකම යටතේ ලියාපදිංචි කර ඇත.

ප්‍රේමසිරි වඩුගේ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාමදාන විනිසුරු (මුළු දිවයිනටම).

2016 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ 12, වාණිජ මහාධිකරණයේ දී ය.

10-426/2

---

## විවිධ දැන්වීම්

### ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

රමේෂ් පතිරණ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ ''ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව සංස්ථාගත කිරීම'' සඳහා වූ පනතකි යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සභාව සංස්ථාගත කිරීමයි :-

(i) මානව හිමිකම් සුරැකීම යන්නෙහි පුළුල් අර්ථය තුළ සැමතන් හි වෙසෙන කාන්තාවන්ගේ සහ ළමුන්ගේ අයිතිවාසිකම් රැකගැනීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය,
(ii) සමාජ අසාධාරණයන්ට සහ ආබාධිත තත්ත්වයන්ට ගොදුරු වූ මව්වරුන් සහ ළමුන්ට, ආධාර උපකාර කිරීම සහ ඔවුන්ගේ ජීවිත නගාසිටුවීම,
(iii) කාන්තාවන්ට සහ ළමුන්ට එරෙහි සියලු ආකාරයේ අපචාර, ප්‍රචණ්ඩ ක්‍රියා සහ අපචාර සිදුවනු වැළැක්වීම.

රමේෂ් පතිරණ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
ගාල්ල දිස්ත්‍රික්කය.

10-04

**දැන්වීමයි**

**(කොළඹ පිහිටි සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය)**

අංක 46, සෙත්තප්පාඩුව, පමුණුගම, මීගමුව දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි එශියනා පබ්ලිශර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Asiana Publishers (Private) Limited) පිළිබඳ කාරණාවේ දී ය.

නඩු අංකය : CHC/30/2016/CO.

2007 අංක 7 දරන සමාගම් පනතේ XII පරිච්ඡේදය යටතේ එශියනා පබ්ලිශර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Asiana Publishers (Private) Limited) අධිකරණය විසින් ගණින් බේරා වසා දැමීම සඳහා සිදු කරනු ලබන ඉල්ලීම පිළිබඳ කාරණාවේ දී ය.

(කොළඹ පිහිටි සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) බස්නාහිර පළාත්බද මහාධිකරණය වෙත ඉහත නම් සඳහන් එශියනා පබ්ලිශර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Asiana Publishers (Private) Limited) ගණින් බේරා වසා දැමීම සඳහා අංක 46, සෙත්තප්පාඩුව, පමුණුගම මීගමුව ස්ථානයේ හි එශියනා පබ්ලිශර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Asiana Publishers (Private) Limited) විසින් වර්ෂ 2016 ජූලි මස 29 වෙනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත් එකී පෙත්සම වර්ෂ 2016 ඔක්තෝබර් 31 වැනි දින අධිකරණය ඉදිරියේ කැඳවිය යුතු බව නියම කරන ලද බවත් එකී පෙත්සම මත නියෝගයක් කිරීම සම්බන්ධව සහයෝගය දැක්වීමට හෝ විරෝධය දැක්වීමට කැමති එකී සමාගමේ ණයහිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම කැඳවන වේලාවේ දී පුද්ගලිකව හෝ නීතිඥවරයෙකු හෝ ලේඛණගත නීතිඥවරයෙකු මඟින් එම අරමුණ වෙනුවෙන් පෙනීසිටීමට හැකි බවත් මෙයින් දන්වනු ලැබේ. තවද, ඉහත කී පෙත්සමේ පිටපතක් ඒ සඳහා වන ගාස්තු ගෙවීම මත අවශ්‍ය වන සමාගමේ සිටි ණයහිමියෙකුට හෝ දයකයෙකුට පහත අත්සන් කරනු ලබන අය විසින් සපයනු ලබන්නේ ය.

කුරේ සහ කුරේ නීතිඥ සමාගම,
අංක 100,
මීගමුව පාර, කඳාන,
දුරකථන අංකය : 011-2226000.

එකී පෙත්සම කැඳවීමේ දී අධිකරණයේ පෙනී සිටීමට අදහස් කරන යම් අයකු එසේ කිරීමට සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ සමාගම වෙත ලිඛිතව පැමිණ හෝ තැපැල් මඟින් භාර දිය යුතුය. පුද්ගලයාගේ හෝ ආයතනයේ නම සමඟ ලිපිනය නොතීසියේ සඳහන් කිරීමට අවශ්‍ය වන අතර එම පුද්ගලයා විසින් හෝ ආයතනය විසින් හෝ පුද්ගලයාගේ හෝ ආයතනයේ සිය නීතිඥවරුන් ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීමට හා එය 2016 ඔක්තෝබර් 26 වෙනි දින පස්වරු 1.00 ට පෙර ඉහත නම් සඳහන් නීතිඥ සමාගම වෙත ලැබෙන සේ කල් වේලා ඇතුව භාර දීමට හෝ තැපැල් කිරීමට අවශ්‍ය වේ.

කුරේ ඇන්ඩ් කුරේ,
පෙත්සම්කාර ලේඛණගත නීතිඥ සමාගම.

අංක 100,
මීගමු පාර,
කඳාන.

10-139

---

**දැන්වීමයි**

**(කොළඹ පිහිටි සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය)**

අංක 46, සෙත්තප්පාඩුව, පමුණුගම, මීගමුව දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි එශියනා එඩ්යුකේෂන් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (Asiana Education Development (Private) Limited) (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණාවේ දී ය.

නඩු අංකය : CHC/31/2016/CO.

2007 අංක 07 දරන සමාගම් පනතේ XII පරිච්ඡේදය යටතේ එශියනා එඩ්යුකේෂන් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (Asiana Education Development (Private) Limited) අධිකරණය විසින් ගණින් බේරා වසා දැමීම සඳහා සිදු කරනු ලබන ඉල්ලීම පිළිබඳ කාරණාවේ දී ය.

(කොළඹ පිහිටි සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) බස්නාහිර පළාත්බද මහාධිකරණය වෙත ඉහත නම් සඳහන් එශියනා එඩියුකේෂන් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (Asiana Education Development (Private) Limited) ගණන් බේරා වසා දැමීම සඳහා අංක 46, සෙත්තප්පාඩුව, පමුණුගම මීගමුව ස්ථානයේ හි එශියනා එඩියුකේෂන් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (Asiana Education Development (Private) Limited) විසින් වර්ෂ 2016 ජූලි මස 29 වෙනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත් එකී පෙත්සම වර්ෂ 2016 ඔක්තෝබර් 31 වැනි දින අධිකරණය ඉදිරියේ කැඳවිය යුතු බව නියම කරන ලද බවත් එකී පෙත්සම මත නියෝගයක් කිරීම සම්බන්ධව සහයෝගය දැක්වීමට හෝ විරෝධය දැක්වීමට කැමති එකී සමාගමේ ණයහිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම කැඳවන වේලාවේ දී පුද්ගලිකව හෝ නීතිඥවරයෙකු හෝ ලේඛණගත නීතිඥවරයෙකු මඟින් එම අරමුණ වෙනුවෙන් පෙනීසිටීමට හැකි බවත් මෙයින් දන්වනු ලැබේ. තව ද, ඉහත කී පෙත්සමේ පිටපතක් ඒ සඳහා වන ගාස්තු ගෙවීම මත අවශ්‍ය වන සමාගමේ සිටි ණයහිමියෙකුට හෝ දයකයෙකුට පහත අත්සන් කරනු ලබන අය විසින් සපයනු ලබන්නේ ය.

කුරේ සහ කුරේ නීතිඥ සමාගම,
අංක 100, මීගමුව පාර, කඳාන,
දුරකථන අංකය : 011-2226000.

එකී පෙත්සම කැඳවීමේ දී අධිකරණයේ පෙනී සිටීමට අදහස් කරන යම් අයකු එසේ කිරීමට සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ සමාගම වෙත ලිඛිතව පැමිණ හෝ තැපැල් මගින් භාර දිය යුතු ය. පුද්ගලයාගේ හෝ ආයතනයේ නම සමග ලිපිනය නොතීසියේ සඳහන් කිරීමට අවශ්‍ය වන අතර එම පුද්ගලයා විසින් හෝ ආයතනය විසින් හෝ පුද්ගලයාගේ හෝ ආයතනයේ සිය නීතිඥවරුන් ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීමට හා එය 2016 ඔක්තෝබර් 26 වැනි දින පස්වරු 1.00 ට පෙර ඉහත නම් සඳහන් නීතිඥ සමාගම වෙත ලැබෙන සේ කල් වේලා ඇතුව භාර දීමට හෝ තැපැල් කිරීමට අවශ්‍ය වේ.

කුරේ ඇන්ඩ් කුරේ,
පෙත්සම්කාර ලේඛනගත නීතිඥ සමාගම.

අංක 100,
මීගමු පාර, කඳාන.

10-138

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2016** | | | |
| **ඔක්තෝබර්** | 2016.10.07 | සිකුරාදා | 2016.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.14 | සිකුරාදා | 2016.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.21 | සිකුරාදා | 2016.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.28 | සිකුරාදා | 2016.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2016.11.04 | සිකුරාදා | 2016.10.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.11.11 | සිකුරාදා | 2016.10.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.11.18 | සිකුරාදා | 2016.11.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.11.25 | සිකුරාදා | 2016.11.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2016.12.02 | සිකුරාදා | 2016.11.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.12.09 | සිකුරාදා | 2016.11.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.12.16 | සිකුරාදා | 2016.12.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.12.23 | සිකුරාදා | 2016.12.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.12.30 | සිකුරාදා | 2016.12.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.